**මැදදුම්බර ප්‍රාදේශීය සභාව - 2021**

**-----------------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන

-------------------

1.1 තත්ත්වාගණනය කළ මතය

----------------------------------

මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනයකරන පාර්ශවයන්ගේ වගකීම්

---------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

----------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 අසම්භාව්‍ය බැරකම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවට විරුද්ධව පවරන ලද නඩු 09 ක් හා සභාව විසින් පවරන ලද එක් නඩුවක් සඳහා නීතිඥ ගාස්තු වශයෙන් ඉකුත් වර්ෂයට හා සමාලෝචිත වර්ෂයට අදාළව පිළිවෙලින් රු.238,500 ක් හා රු.9,000 ක් වශයෙන් එකතුව රු.247,500 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණද එම නඩු පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | විසඳී නොමැති නඩු පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.193,575,768 ක වත්කම් විෂයයන් 08 කට අදාළ ශේෂ හා ඒවාට අදාළ උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂ අතර රු.34,797,401 ක වෙනසක් පැවතුණි. | උපලේඛන යාවත්කාලීන කිරීමට හා අදාළ ලෙජරයන් නිවැරදි කරන බව දන්වා ඇත. | වෙනස්කම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදුකළ යුතුය. |

1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැති වීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්, ලේඛන හා උපලේඛනවල ඇතුළත් වී නොමැති, පෙර වර්ෂවල සිට පැවත එන රු.754,812ක හඳුනා නොගත් ගිණුම් ශේෂ 02 ක් නිරවුල් කර නොතිබුණි. | අදාළ ශේෂය නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතින බව දන්වා ඇත. | ශේෂ හඳුනාගෙන නිරවුල් කළ යුතුය. |

1.7 අනුකූල නොවීම්

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි පරීක්ෂණයේදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට විධානයට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය | සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන හෝටල් 09 ක තත්‍ය ආදායම මූල්‍ය ප්‍රකාශන අනුව සනාථ කර ගැනීමකින් තොරව රු.741,181 ක ගාස්තු අයකර තිබුණි. | නිරීක්ෂණයේ ඇතුළත් සමහර හෝටල් සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි වී නොමැති අතර මේ පිළිබඳ තහවුරු කරගෙන ඉදිරි කටයුතු සිදුකරන බව දන්වා ඇත. | ලැබිය යුතු ආදායම් නිවැරදිව හඳුනාගෙන ගාස්තු අයකර ගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2)(ආ) | තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදෙන කාර්යයන් නිම කළ විගස පියවිය යුතු වුවද විවිධ කාර්යයන් සඳහා අවස්ථා 17 කදී සමාලෝචිත වර්ෂය තුළ ලබාදී තිබුණු රු.1,698,650 ක තත්කාර්ය අතුරු අග්‍රිම දින 07 සිට දින 303 දක්වා කාල ප්‍රමාදයකින් පසුව පියවා තිබුණි. | ඉදිරියේදී අදාළ කාර්යය නිමවූ වහාම අත්තිකරම් පියවන ලෙස දැනුවත් කර ඇති බව දන්වා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කාල ප්‍රමාදයකින් තොරව තත්කාර්ය අතුරු අග්‍රිම පියවීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 571 (2) | තැන්පත් කර වසර 02ක් ඉක්මවූ එකතුව රු.1,107,403 ක තැන්පතු ශේෂ 68 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව අදාළ කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේදී වසර 02 ඉක්මවූ තැන්පත් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකරන බව දන්වා ඇත. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.31,365,221 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.22,588,403 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
-------------------------

ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය
------------------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට පැවති රු.1,119,875 ක හිඟ වරිපනම් ශේෂයෙන් රු.296,672 ක් හෙවත් සියයට 26 ක් පමණක් අයකර ගෙන තිබුණු අතර ප්‍රාදේශීය සභා පනතේ 158 විධිවිධාන ප්‍රකාරව එම හිඟ ගාස්තු අය කර ගෙන නොතිබුණි. | විධිමත් සැලැස්මක් යටතේ වරිපනම් අය කර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව හිඟ ආදායම් අයකර ගත යුතුය. |
| (ii) | සභාවේ මුළු ජල පාරිභෝගිකයින් 911 න් 151 කට එනම් සියයට 17 ක් සඳහා ජල මනු සවිකර නොතිබුණු අතර ගෘහස්ථ පාරිභෝගිකයන් සඳහා මාසිකව රු.150 ක හා ව්‍යාපාරිකයන් සඳහා මාසිකව රු.500 ක ගාස්තු අය කරන බැවින් ජල පරිභෝජනය මත සභාවට ලැබිය යුතු ආදායම අහිමි වී තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණු හිඟ ජල ගාස්තුව රු.874,551 ක් විය. | ජල මීටර් සවිකර ජල යෝජනා ක්‍රමය විධිමත් කිරීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කරන බව ගාස්තු නොගෙවූ අයගේ ජල සම්බන්ධතාව විසන්ධි කිරීමට කටයුතු කර ඇති බව දන්වා ඇත. | ජල පාරිභෝගිකයින්ට ජල මනු සවිකර ජල පරිභෝජනය මත ගාස්තු අයකළ යුතු අතර හිඟ ජල ගාස්තු අයකර ගත යුතුය. |

(ආ) කඩ කුලී

------------

| | | | |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු කුලී ශේෂය රු.4,142,177 ක් වූ අතර ගිවිසුම් අනුව හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ තුළ රු.100,000 ක් ඉක්මවූ කඩ කාමර 13 ක් වෙනුවෙන් අයවිය යුතු ශේෂය රු.2,158,880 ක් විය. | මේ වන විට රු.363,000 ක් ගෙවා ඇති අතර රු.178,483 ක් කපා හැර ඇති බවත් රු.377,283 ක් කපා හැරීම සඳහා යොමුකර ඇති බවත් දන්වා ඇත. | ගිවිසුම් අනුව හිඟ මුදල් අයකර ගත යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට අයවිය යුතු රු.4,232,629 ක බදු කුලී ශේෂයෙන් රු.916,290 ක් ද සමාලෝචිත වර්ෂයේ රු.3,130,747 ක බිල් කිරීමෙන් රු.2,410,879 ක් ද වශයෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.3,327,169 ක් පමණක් අය කිරීම හේතුවෙන් ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය සියයට 45 ක් විය. | හිඟ මුදල් ලබා ගැනීමට සමථ මණ්ඩලයට යොමු කොට ඇති අතර 2022 ජූනි 30 දිනට හිඟය සඳහා නඩු පැවරීමට නියමිත බව දන්වා ඇත. | ගිවිසුම් අනුව මාසික කුලී හා හිඟ ශේෂ අයකර ගත යුතුය. |
| (iii) | සභාව සතු කඩ කාමර 06 කට අදාළව ගිවිසුම් සංශෝධනය නොකර 2015 වර්ෂයේ තක්සේරුවට අනුව පැරණි ගිවිසුම් යටතේම කඩ කාමර කුලී අයකර තිබුණි. | නව තක්සේරු ක්‍රියාත්මක කිරීම හා නව ගිවිසුම්වලට එළඹීම තාවකාලිකව අත්හිටුවා ඇති අතර නව තක්සේරු ක්‍රියාත්මක කිරීමට පළාත් පාලන කොමසාරිස් උපදෙස් සඳහා ලිඛිතව දැනුම් දී ඇති බව දන්වා ඇත. | නව තක්සේරුවක් අනුව ගිවිසුම් සංශෝධනය කර කුලී අයකර ගත යුතුය. |

(ඇ) වෙනත් ආදායම්

--------------------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.2,320,335 ක ත්‍රිරෝද රථ ගාස්තු හිඟයෙන් වසර 05 ට වැඩි කාලයක් හිඟ හිටි රු.952,970 ක් ද, වසර 2 සිට 4 අතර කාල පරාසයක් හිඟ හිටි රු.795,495 ක් ද වූ අතර හිඟ ගාස්තු අයකර ගැනීම සඳහා සභාව විසින් කටයුතු කර නොතිබුණි. | මෙම හිඟය තුළ රු.365,100 ක් වැරදි ලෙස බිල් කිරීමක් වන අතර එය කපා හැරීම සඳහා යොමුකර ඇති බවද ඉතිරි ගාස්තු විධිමත් සැලැස්මක් සකස් කර අයකර ගැනීමට කටයුතු කරන බවද දන්වා ඇත. | හිඟ ආදායම් අයකර ගත යුතුය. |